# ගිණුම්කරණය - 9 ඒකකය - අසම්පූර්ණ සටහන්

1.නිසි පරිදි ගිණුම් වාර්තා තබා නොගන්නා ව්‍යාපාරයක 2020/03/31න් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අනාවරණය කර ගෙන ඇත.

| | රු. |
|---|---|
| විකුණුම් | 1,600,000 |
| ආපසු යැවුම් | 30,000 |
| ගෙන ඒමේ කුලී | 20,000 |
| 2019/04/01 තොගය | 65,000 |
| 2020/03/31 තොගය | 300,000 |

දළ ලාභ අනුපාතය පිරිවැයට 33 1/3%කි.
කාලච්ඡේදයේ ගැනුම්වල වටිනාකම වන්නේ,

1. රු.1,475,000
2. රු.1,445,000
3. රු.1,425,000
4. රු.1,415,000
5. රු.1,410,000

2. වර්ෂයක් තුළදී වෙළෙඳ ණයගැතියන්ගේ වැඩිවීම රු.40,000ක් සහ එම වර්ෂය තුළ ණයට විකුණුම් රු.200,000ක් ලෙස දී ඇති විට ගිණුම් වර්ෂය තුළ ණයගැතියන්ගෙන් ලද මුදල කොපමණද?

1. රු.40,000
2. රු.120,000
3. රු.200,000
4. රු.240,000
5. රු.160,000

3.ආධුනික ගිණුම් ලිපිකරුවෙකු විසින් X ව්‍යාපාරයේ විකුණුම් කොමිස් වැරදීමකින් විකුණුම් ගිණුමට හර කළේ නම් පහත කුමක් අවතක්සේරු විය හැකිද?

1. දළ ලාභය
2. හිමිකම
3. වර්ෂයේ ලාභය
4. විකුණුම් පිරිවැය
5. ණයගැතියන්ගෙන් එකතු කළ මුදල්

4.ගින්නක් හට ගෙන ගබඩාවේ තිබූ සමස්ත තොගයම විනාශ විය.එදිනට පහත තොරතුරු ලැබිණ.

වර්ෂයේ ආරම්භක තොගය රු.120,000
වර්ෂයේ විකුණුම් රු.750,000
වර්ෂයේ මිලට ගැනුම් රු.720,000

විකුණුම් මත දළ ලාභ අනුපාතය 20%කි.විනාශ වූ තොගය කොපමණද?

1. රු.120,000
2. රු.130,000
3. රු.240,000
4. රු.250,000
5. රු.260,000

5.නිමි ඇඳුම් අලෙවි කරන ව්‍යාපාරයක 2020/01/01 දිනට රෙදි තොගයේ පිරිවැය රු.784,000කි.2020/12/31 වන විට රු.1,496,000ක තොග,සැපයුම්කරුවන්ගෙන් ලබා ගෙන තිබුණි.විකුණුම් රු.1,554,000කි.දළ ලාභය පිරිවැයට 40%කි.2020/12/31 ඇති වූ ගංවතුර නිසා රෙදි තොග විශාල ප්‍රමාණයක් විනාශ විය.නමුත් පිරිවැය රු.380,000ක් වූ නිමි තොග බේරා ගැනීමට හැකි විය.ගංවතුරෙන් විනාශ වූ තොගයේ පිරිවැය වන්නේ,

1. රු.590,000
2. රු.690,000
3. රු.1,900,000
4. රු.790,000
5. රු.1,110,000

- සඳලිගේ ව්‍යාපාරයේ අසම්පූර්ණ වාර්තාවලින් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

| | | රු. |
|---|---|---|
| 2020/01/01 දිනට | මුදල් ශේෂය | 3,000 |
| | ණයගැතියන්ගෙන් ලැබිය යුතු | 2,000 |
| 2020 වර්ෂය තුළදී | ගනුදෙනුකරුවන්ගෙන් ලද මුළු මුදල | 15,000 |
| | ණයට ගැනුම් | 8,000 |
| 2020/12/31 දිනට | ණයගැතියන්ගෙන් ලැබිය යුතු | 2,000 |
| | ණයහිමියන්ට ගෙවිය යුතු | 1,000 |

6. මුළු විකුණුම් ප්‍රමාණය රු.................................
7. ණයහිමියන්ට ගෙවූ මුළු මුදල රු....................................
8. 2020/12/31 දිනට මුදල් ශේෂය රු...........................

9. හිමාලිගේ ව්‍යාපාරයේ ණය පොලී පිළිබඳ පහත තොරතුරු ඔබට සපයා ඇත.

| | |
|---|---|
| 2019/03/31 දිනට උපචිත පොලී | රු.3,000 |
| 2020/03/31 දිනට උපචිත පොලී | රු.2,000 |
| ආදායම් ප්‍රකාශයේ අඩු කර ඇති පොලී | රු.10,000 |

වර්ෂය තුළ ණය වාරිකය මුදලින් ගෙවූ අතර එහිදී ණය රු.11,000කින් අඩුවී ඇත.
වර්ෂය තුළ ගෙවූ ණය වාරිකය රු.............................

10.ණය වාරිකය තුළ ඇතුළත් පොලිය කොපමණද?

<u>පිළිතුරු</u>

| | |
|---|---|
| 1.) 2 | 6.) 15,000 |
| 2.) 5 | 7.) 7,000 |
| 3.) 1 | 8.) 11,000 |
| 4.) 3 | 9.)22,000 |
| 5.) 4 | 10.) රු.11,000 |


**<u>සකස් කළේ -</u>**

**රසිකා ජිනසේන මිය,**

**ර/ධර්මාලෝක ම.වි.**